

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

விளையாட்டுஅபிவிருத்தித் திணைக்களம்

**Department of Sports Development**

Printed by: Nelum Printers–0112 519601, 0773 179599



# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகைஅறிக்கை

# Annual Performance Report

# 2016

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2016

**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව,**

**අංක 9, පිලිප් ගුණවර්ධන මාවත,**

**කොළඹ 07**

## ➢ දැක්ම

ක්‍රීඩාව තුළින් ආසියාවේ අභිමානවත් ජාතියක් බවට පත්වීම.

## ➢ මෙහෙවර

ක්‍රීඩාවේ යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනයට අදාල උපාය මාර්ගික මෙහෙයුම් ක්‍රියාවට නැගීම තුළින් ක්‍රීඩා සංස්කෘතියක් බිහිකිරීමත්, නීරෝගී, විනයගරුක ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහි කිරීමත් මගින් රටේ සංවර්ධනය ළඟා කර ගනිමින් ශ්‍රී ලංකාව ආසියාවේ අභිමානවත් ජාතියක් බවට පත් වීම

## ➢ හැඳින්වීම

60 දශකයේ මැද භාගයේ දී කුඩා ඒකකයක් ලෙස ආරම්භ කරන ලද ක්‍රීඩා සංවර්ධනය 1966 දී ජනසතු සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රීඩා අංශයක් ලෙස ස්ථාපිත කරන ලදී. 1968 දී ක්‍රීඩා දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද අතර 1970 දී ක්‍රීඩා විෂයය භාර අමාත්‍යාංශයක් වශයෙන් පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය පිහිටුවා ක්‍රීඩා දෙපාර්තමේන්තුව ඒ යටතට ගනු ලැබීය.

1989 දී යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී 1996 දී ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් බවට උසස් විය. 2000 දී සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ද, 2003 දී තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ හා 2004 සිට ක්රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතටත්, 2007 දී ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ද, 2010 සිට ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ද ක්‍රීඩාව වෙනුවෙන් සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටු කරමින් ක්‍රියාත්මක වේ.

<u>**කාර්යභාරය**</u>

1. **මානව සම්පත් සංවර්ධනය**
   - ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දීම.
   - ක්‍රීඩක ක්‍රීඩිකාවන් දේශීය හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩා තරගවලට යොමු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.
   - ක්‍රීඩා පුහුණුකරුවන්ට හා නිලධාරීන්ට විදේශ පුහුණුව ලබා දීම.
   - විදේශ පුහුණුකරුවන් මගින් ශ්‍රී ලාංකික පුහුණුකරුවන් පුහුණු කිරීම.
   - ක්‍රීඩා නිලධාරීන්ට නව තාක්ෂණය හඳුන්වා දීම සඳහා වැඩමුළු සංවිධානය කිරීම.
   - දේශීය හා විදේශීය ක්‍රීඩා විශේෂඥයන් ලවා ක්‍රීඩා නිලධාරීන්ට හා පුහුණුකරුවන්ට ක්‍රීඩා සම්මන්ත්‍රණ පැවැත්වීම.
   - දේශීය හා විදේශීය ක්‍රීඩා අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම.

**2. යටිතල පහසුකම් සංවර්ධනය**

- ජාත්‍යන්තර තරඟ සඳහා යෝග්‍ය ක්‍රීඩා සංකීර්ණ ඇති කිරීම.
- ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම හා නවීකරණය කිරීම.
- ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය.
- ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සැපයීම.

මෙම කාර්යභාරයන් ඉටු කිරීම සඳහා 2016 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය හා 2016.12.31 දින වන විට ලබා ඇති ප්‍රගතිය පහත දැක්වේ.

| වැය විෂයය | 2016 වාර්ෂික ප්‍රතිපාදන (රු.මි) | මූල්‍ය වියදම් (රු.මි) | | අතැති බිල්පත් (රු.මි) | | මුළු එකතුව (රු.මි) | ප්‍රගතිය % | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ක්‍රී.සං.දෙ. | දි.ලේ. | ක්‍රී.සං.දෙ. | දි.ලේ. | | මූල්‍ය | භෞතික |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | | | | | | |
| මූලධන | 8.10 | 6.47 | 0.00 | 0.20 | 0.00 | 6.67 | 82 | 90 |
| පුනරාවර්තන | 58.87 | 53.01 | 0.00 | 0.29 | 0.00 | 53.30 | 91 | 95 |
| **සංවර්ධන ක්‍රියාකාරකම්** | | | | | | | | |
| මූලධන | 2076.29 | 1015.85 | 283.03 | 528.49 | 33.68 | 1861.05 | 90 | 90 |
| පුනරාවර්තන | 668.43 | 666.28 | 0.00 | 165.12 | 0.00 | 831.40 | 124 | 100 |
| **එකතුව** | **2811.69** | **1741.61** | **283.03** | **694.09** | **33.68** | **2752.42** | **98** | **95** |

** 2016.12.31 දිනට අතැති බිල්පත්වල අගය වන රු.මිලි. 727.77 ද ඉහත වගුවේ මූල්‍ය ප්‍රගතියෙහි ඇතුළත් කර ඇත.

# 1.මානව සම්පත් සංවර්ධනය

## 1.1. 42 වන ජාතික මහා ක්‍රීඩා උළෙල

දිවයිනේ පළාත් මට්ටමින් තෝරා ගනු ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික තලයට කැඳවා, දක්ෂයින් හඳුනා ගැනීම සහ දක්ෂතා ඔප් නැංවීමට අවස්ථාව ලබා දෙමින් ජාත්‍යන්තර තලයට යොමු කිරීම අරමුණු කොට ගෙන වාර්ෂිකව මෙම උළෙල පවත්වනු ලබයි. ඒ අනුව අන්තර් ක්‍රීඩා සමාජ තරග, දිස්ත්‍රික් මට්ටමේ තරග, පළාත් මට්ටමේ තරග පැවැත්වීමෙන් අනතුරුව අවසන් අදියර වශයෙන් ජාතික මහා ක්‍රීඩා උළෙල අති උත්කර්ශවත් අයුරින් පවත්වනු ලබයි.

42 වන ජාතික මහා ක්‍රීඩා උළෙල යාපනය දොරෙයිඅප්පා ක්‍රීඩාංගණයේ දී අතිසාර්ථක ලෙස පවත්වනු ලැබීය. ඉසව් 33 ක් වෙනුවෙන් දිවයිනේ පළාත් නවයම නියෝජනය කරමින් සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් තම පළාතේ ජයග්‍රහණය වෙනුවෙන් එකිනෙකා අභිබවමින් තරග වැදුණු අතර මෙවර ජාතික මහා ක්‍රීඩා උළෙලේ දී රන්පදක්කම් 113 ක් ලබාගත් බස්නාහිර පළාත සමස්ථ ශූරතාවය දිනා ගන්නා ලදී. මෙවර ක්‍රීඩා උළෙල සඳහා ප්‍රථම වරට කඹ ඇදීමේ තරගය ඇතුළත් කරන ලදී. යාපනය දොරෙයිඅප්පා ක්‍රීඩාංගණයේ දී නව ශ්‍රී ලංකා තරග වාර්තා 06 ක් හා නව තරගාවලි වාර්තා 31 ක් බිහි වීම කැපී පෙනෙන සිද්ධියක් වන අතර 42 වන ජාතික මහා ක්‍රීඩා උළෙල සඳහා රුපියල් මිලියන 131.46 ක වැය දැරීමක් සිදු කර ඇත.

### 1.1.1. 42 ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් අනුව සමස්ත පදක්කම් සටහන

| අංකය | පළාත | පදක්කම් | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | රන් | රිදී | ලෝකඩ | |
| 1. | බස්නාහිර | 113 | 74 | 67 | 254 |
| 2. | දකුණ | 33 | 29 | 43 | 105 |
| 3. | මධ්‍යම | 28 | 38 | 41 | 107 |
| 4. | වයඹ | 23 | 38 | 38 | 99 |
| 5. | සබරගමුව | 16 | 24 | 44 | 84 |
| 6. | උතුරු මැද | 15 | 17 | 43 | 75 |
| 7. | ඌව | 12 | 15 | 34 | 61 |
| 8. | නැගෙනහිර | 7 | 12 | 11 | 30 |
| 9. | උතුර | 2 | 5 | 5 | 12 |
| **එකතුව** | | **249** | **252** | **326** | **827** |

**1.1.2. 42 ජාතික මහා ක්‍රීඩා උළෙලේ දී බිහි වූ නව තරග වාර්තා**

<u>නව ශ්‍රී ලංකා තරග වාර්තා</u>

| අංකය | ක්‍රීඩකයාගේ නම | ක්‍රීඩාව | පළාත | දක්ෂතාවය |
|---|---|---|---|---|
| 01 | ඉෂාර සදරුවන් | රිටි පැනීම - පිරිමි | බස්නාහිර | මීටර් 5.10 |
| 02 | ඩබ්.කේ.එල්.ඒ.නිමාලි | මීටර් 800- කාන්තා | දකුණ | වි. 2.03.5 |
| 03 | ජේ.අනීතා | රිටි පැනීම - කාන්තා | උතුරු | මීටර් 3.41 |
| 04 | ඩබ්.ටී.කේ.ප්‍රනාන්දු | යගුලිය විසිකිරීම - කාන්තා | බස්නාහිර | මීටර් 15.25 |
| 05 | එස්.එම්.පීටර්ස් | බර ඉසිලීම<br>( කිලෝ ග්‍රෑම් - 105) - පිරිමි | මධ්‍යම | කිලෝ ග්‍රෑම් 307 |
| 06 | ඒ.ජී.එස්.අබේවික්‍රම | බර ඉසිලීම<br>( කිලෝ ග්‍රෑම් -105 ට වැඩි)<br>- පිරිමි | මධ්‍යම | කිලෝ ග්‍රෑම් 302 |

<u>නව තරග වාර්තා</u>

| අංකය | ක්‍රීඩකයාගේ නම | ක්‍රීඩාව | පළාත | දක්ෂතාවය |
|---|---|---|---|---|
| 01 | ඒ.ඩබ්.ඒ.එස්.එම් අමරසිංහ | මිටිය විසිකිරීම - කාන්තා | දකුණ | මීටර් 45.85 |
| 02 | ආර්.පී.ඩබ්.වරුණ ලක්ෂාන් | හෙල්ල විසිකිරීම - පිරිමි | වයඹ | මීටර් 78.52 |
| 03 | ජී.ටී.ඒ.අබේරත්න | මීටර් 1500 - කාන්තා | දකුණ | වි. 4.18.7 |
| 04 | ජේ.ඒ.එස්.දුලානි<br>කේ.ඒ.ඩී.සදකාන්ති<br>ජී.ටී.ඒ.අබේරත්න<br>ඩබ්.කේ.එල්.ඒ.නිමාලි | මීටර් 400*4 සහාය දිවීම | දකුණ | වි.3.43.5 |
| 05 | ඉමේෂ් චතුරංග | පිහිණුම් මීටර් 200<br>පසු පස ආර | බස්නාහිර | වි 2.18.57 |
| 06 | අකලංක පීරිස් | පිහිණුම් මීටර් 50<br>සමනල ආර | බස්නාහිර | තත්. 25.81 |
| 07 | අකලංක පීරිස් | පිහිණුම් මීටර් 50<br>පසු පස ආර | බස්නාහිර | තත්. 27.94 |

| අංකය | ක්‍රීඩකයාගේ නම | ක්‍රීඩාව | පළාත | දක්ෂතාවය |
|---|---|---|---|---|
| 08 | කෞෂාල් මානවඩු | පිහිණුම් - මීටර් 100 සමනල ආර | බස්නාහිර | තත්. 58.29 |
| 09 | දිලංක ෂෙහාන් | පිහිණුම් - මීටර් 1500 නිදහස් ආර | බස්නාහිර | වි 17.56.83 |
| 10 | විනෝලි කලුආරච්චි | පිහිණුම් - මීටර් 50 පසු පස ආර | බස්නාහිර | තත්. 31.74 |
| 11 | විනෝලි කලුආරච්චි | පිහිණුම් - මීටර් 100 පසු පස ආර | බස්නාහිර | වි 01.08.15 |
| 12 | ඉෂානි සේනානායක | පිහිණුම් - මීටර් 200 නිදහස් ආර | බස්නාහිර | වි 02.16.91 |
| 13 | කේ.ඒ. හිරුණි පෙරේරා | පිහිණුම් - මීටර් 200 නිදහස් ආර | බස්නාහිර | වි 02.41.04 |
| 14 | ඉෂානි සේනානායක | පිහිණුම් - මීටර් 800 නිදහස් ආර | බස්නාහිර | වි 09.55.00 |
| 15 | විනෝලි කලුආරච්චි | පිහිණුම් - මීටර් 200 පසු පස ආර | බස්නාහිර | වි 02.31.25 |
| 16 | ඔනේත්‍රා වීරසිංහ | පිහිණුම් - මීටර් 200 පසු පස ආර | මධ්‍යම | වි 02.41.36 |
| 17 | කේ.ඒ. හංසි පෙරේරා | පිහිණුම් - මීටර් 200 සමනල ආර | බස්නාහිර | වි 02.43.99 |
| 18 | නබාෂි මන්දස්මිත | පිහිණුම් - මීටර් 200 සමනල ආර | බස්නාහිර | වි 02.51.13 |
| 19. | පුල්වනී ජයතිලක | පිහිණුම් - මීටර් 200 සමනල ආර | බස්නාහිර | වි. 02.51.21 |
| 20 | රමුදි සමරකෝන් | පිහිණුම් - මීටර් 50 ලය ආර | බස්නාහිර | තත්. 36.73 |
| 21 | රමුදි සමරකෝන් | පිහිණුම් - මීටර් 100 ලය ආර | බස්නාහිර | වි. 01.19.52 |
| 22 | කේ.ඒ. හිරුණි පෙරේරා | පිහිණුම් - මීටර් 100 සමනල ආර | බස්නාහිර | වි. 01.09.18 |
| 23 | රමුදි සමරකෝන් | පිහිණුම් - මීටර් 200 ලය ආර | බස්නාහිර | වි. 02.51.90 |
| 24 | මෙලානි ප්‍රනාන්දු | පිහිණුම් - මීටර් 200 ලය ආර | බස්නාහිර | වි. 02.56.24 |
| 25 | ෂෙහානි තරුෂා | පිහිණුම් - මීටර් 200 ලය ආර | බස්නාහිර | වි. 03.02.71 |
| 26 | ඉෂානි සේනානායක | පිහිණුම් - මීටර් 400 නිදහස් ආර | බස්නාහිර | වි. 04.54.30 |
| 27 | ඩබ්.සී.එම්. වර්ණකුලසූරිය | බර ඉසිලීම (කාන්තා) කිලෝ ග්‍රෑම් 53 | බස්නාහිර | කිලෝ ග්‍රෑම් 166 |
| 28 | වී.සී. ප්‍රියන්ති | බර ඉසිලීම (කාන්තා) කිලෝ ග්‍රෑම් 69 | දකුණ | කිලෝ ග්‍රෑම් 172 |
| 29 | ඩබ්.ටී.කේ. ප්‍රනාන්දු | යගුලියවිසිකිරීම (කාන්තා) | බස්නාහිර | මීටර් 15.25 |
| 30 | එම්.එච්.අයි. සඳරුවන් | රිටි පැනීම ( පිරිමි) | බස්නාහිර | මීටර් 15.10 |
| 31 | ඩබ්.කේ.එල්.ඒ. නිමාලි | මීටර් 800 (කාන්තා) | දකුණ | වි. 02.03.05 |







ජාතික මහා ක්‍රීඩා
උළෙල

## 1.2. <u>ජාත්‍යන්තර තරග ජයග්‍රහණ හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීම</u>

### 1.2.1 <u>12 වන දකුණු ආසියානු තරගාවලිය</u>

රටවල් 8 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 2672 සහභාගීත්වයෙන් ඉන්දියාවේ ගුවහාති ඉන්දිරා ගාන්ධි ක්‍රීඩාංගණයේ දී මෙවර දකුණු ආසියානු තරගාවලිය සාර්ථක අන්දමින් අවසන් වූයේ ශ්‍රී ලංකාව මෑතක ජාත්‍යන්තර තරඟ බිමක දී ලබා ගත් වැඩිම පදක්කම් ප්‍රමාණය ලබාගනිමිනි. එහිදී රන් පදක්කම් 25 ක්, රිදී පදක්කම් 63 ක්, ලෝකඩ පදක්කම් 98 ක් හිමි කරගැනීමට ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත් වූහ.

මෙවර තරගාවලියේ දී පිහිනුම් අංශයෙන් රන් පදක්කම් 12 ක් දිනා ගැනීමට හැකි වූ අතර කැපී පෙනෙන දක්ෂතා පෙන්නුම් කළ මැතිව්ස් අබේසිංහ රන් පදක්කම් 08 ක් ශ්‍රී ලංකාව වෙනුවෙන් දිනා දීමට සමත්විය. එමෙන්ම මළල ක්‍රීඩා අංශයෙන් රන් පදක්කම් 09 දිනා ගැනීමට හැකි විය.

මෙම තරගාවලියේ පදක්කම්ලාභීන් හා ඔවුන්ගේ පුහුණුකරුවන් ඇගයීම සඳහා ක්‍රීඩා අමාත්‍යතුමාගේ සංකල්පයක් අනුව ඔවුන් වෙත මුදල් තිළිණ ලබාදීමක් සිදු කරන ලදී. රන් පදක්කම්ලාභියෙක් වෙනුවෙන් රු. ලක්ෂ 5 ක් ද, රිදී පදක්කම්ලාභියෙක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 3 ක් ද, ලෝකඩ පදක්කම්ලාභියෙක් වෙනුවෙන් රුපියල් ලක්ෂයක මුදලක් ද පිරිනමන ලදී.

මෙයට අමතරව පොදුරාජ්‍ය මණ්ඩලීය සව් එසවීමේ ශූරතාවලිය, ආසියානු නෙට්බෝල් ශූරතාවලිය, ආසියානු රග්බි සත් සාමාජික තරඟාවලිය, ආසියානු රග්බි ශූරතාවලිය, පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙල, ආසියානු සව් එසවීමේ තරඟාවලිය, පොදු රාජ්‍ය මණ්ඩලීය බර ඉසිලීමේ ශූරතාවලිය හා 07 වන ලෝක කැරම් ශූරතාව යන ජාත්‍යන්තර තරගවලින් රන්, රිදී, ලෝකඩ පදක්කම් ලැබූ පදක්කම්ලාභීන් මෙන්ම ඔවුන්ගේ පුහුණුකරුවන් වෙනුවෙන් ද මුදල් තිළිණ ලබාදීමක් සිදු කරන ලදී.









12 වන දකුණු ආසියානු තරගාවලිය

### 1.2.1.1. 2016 වර්ෂය තුළ දී ලබාගත් ජාත්‍යන්තර තරග ජයග්‍රහණ

| අංකය | ක්‍රීඩාව | තරගාවලිය | පැවැත් වූ රට | පදක්කම් | | |
|---|---|---|---|---|---|---|
| | | | | රන් | රිදී | ලෝකඩ |
| 01 | මළල ක්‍රීඩා | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | 09 | 11 | 17 |
| | | ආසියානු ගෘහස්ථ ශූරතාවලිය | කටාර් | - | 01 | 01 |
| | | The Great Relay Championship | තායිලන්තය | - | 01 | - |
| | | 26 වන කස්යානෝව් අනුස්මරණ තරගාවලිය | කසකස්ථානය | - | 01 | 01 |
| | | තායිලන්ත විවෘත මළල ක්‍රීඩා තරගාවලිය | තායිලන්තය | 05 | 01 | 03 |
| | | 6 වන ආසියානු ළමා අන්තර්ජාතික ක්‍රීඩා තරගාවලිය | රුසියාව | 02 | 07 | 04 |
| | | ඉන්දියානු ග්‍රෑන්ඩ් පික්ස් තරගාවලිය | ඉන්දියාව | - | 01 | 01 |
| | | වියට්නාම විවෘත මළල ක්‍රීඩා තරගාවලිය | වියට්නාමය | 02 | 01 | 01 |
| | | මොක්පෝ ජාත්‍යන්තර විසිකිරීමේ තරගාවලිය | දකුණු කොරියාව | 01 | 01 | - |

| අංකය | ක්‍රීඩාව | තරගාවලිය | පැවැත් වූ රට | පදක්කම් | | |
|---|---|---|---|---|---|---|
| | | | | රන් | රිදී | ලෝකඩ |
| 02 | ජිම්නාස්ටික් | පොදු රාජ්‍ය මණ්ඩල ශූරතාවලිය | නැම්බියාව | - | - | 01 |
| 03 | පාපැදි | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | 02 | 02 | 03 |
| 04 | බර ඉසිලීම | පොදු රාජ්‍ය මණ්ඩල ශූරතාවලිය | මැලේසියාව | 01 | 04 | 06 |
| | | | ඉන්දියාව | 01 | 09 | 05 |
| 05 | බැඩ්මින්ටන් | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | 02 | 06 |
| 06 | වෙඩිතැබීම | 8 වන ආසියානු වායු රයිෆල් ශූරතාවලිය | ඉන්දියාව | - | 01 | - |
| | | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | 04 | 08 |
| 07 | ස්කොෂ් | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | - | 03 |
| 08 | වුෂු | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | 01 | 01 | 04 |
| 09 | මල්ලවපොර | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | 05 | 03 |
| 10 | පිහිණුම් | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | 12 | 16 | 11 |
| 11 | බොක්ෂිං | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | 05 | 04 |
| 12 | දුනු විදීම | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | 02 | - |
| 13 | වොලිබෝල් (පිරිමි/ගැහැණු) | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | 02 | - |
| 14 | ටෙනිස් | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | - | 06 |
| 15 | මේස පන්දු | දකුණු ආසියානු කණිෂ්ඨ මේස පන්දු තරගාවලිය | පාකිස්ථානය | 09 | 03 | 01 |
| | | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | 01 | 10 |

| අංකය | ක්‍රීඩාව | තරගාවලිය | පැවැත් වූ රට | පදක්කම් | | |
|---|---|---|---|---|---|---|
| | | | | රන් | රිදී | ලෝකඩ |
| 16 | පැසිපන්දු | දකුණු ආසියානු පැසිපන්දු ශූරතාවලිය | නේපාලය | 01 | - | - |
| | | දකුණු ආසියානු පැසිපන්දු ශූරතාවලිය | බංගලාදේශය | - | - | 01 |
| 17 | කබඩි | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | - | 02 |
| | | කණිෂ්ඨ ආසියානු කබඩි ශූරතාවලිය | ඉරානය | - | - | 02 |
| | | ආසියානු තරගාවලිය (කාන්තා) | දකුණු කොරියාව | - | - | 01 |
| | | 3 වන ආසියානු වෙරළ කබඩි තරගාවලිය | වියට්නාමය | - | - | 02 |
| 18 | කරාතේ දෝ | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | 09 | 14 | 28 |
| | | විවෘත කරාතේ දෝ තරගාවලිය | චීනය | 06 | 01 | 02 |
| 19 | දැල්පන්දු | යූ 21ආසියානු කණිෂ්ඨ තරගාවලිය | හොංකොං | 01 | - | - |
| | | ආසියානු ලෝක ශූරතාවලිය | බැංකොක් | - | 01 | - |
| 20 | කැරම් | ලෝක ශූරතා තරගාවලිය | එංගලන්තය | 01 | - | - |
| 21 | ජූඩෝ | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | 01 | - |
| | | එක්ස්පෝ ජූඩෝ ශූරතාවලිය | ඉන්දියාව | 04 | 06 | 04 |
| | | උතුරු බැංකොක් විශ්වවිද්‍යාලිය ශූරතාවලිය | තායිලන්තය | - | 03 | 05 |
| 22 | තුන් ප්‍රයාම | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | - | 01 |
| 23 | හොකී | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | - | 01 |

| අංකය | ක්‍රීඩාව | තරගාවලිය | පැවැත් වූ රට | පදක්කම් | | |
|---|---|---|---|---|---|---|
| | | | | රන් | රිදී | ලෝකඩ |
| 24 | තයිකොන්ඩෝ | ටයිරක් ජාත්‍යන්තර තයිකොන්ඩෝ ශූරතාවය | තායිලන්තය | 01 | 01 | 03 |
| | | 12 වන දකුණු ආසියානු තරගාවලිය | ඉන්දියාව | - | 01 | 04 |
| | | 10th Classic Internationl Open Taekwondo Game | මැලේසියාව | - | 02 | 03 |
| | | අන්තර්ජාතික ආරාධිත තයිකොන්ඩෝ තරගාවලිය | මැලේසියාව | 01 | 03 | 03 |
| | | 1 වන බැන්කීන් මූන් අන්තර්ජාතික තයිකොන්ඩෝ ශූරතාවලිය | දකුණු කොරියාව | 01 | - | - |
| | | 11 අන්තර්ජාතික විවෘත මිත්‍ර තයිකොන්ඩෝ තරගාවලිය | ඇමරිකා එක්සත් ජනපදය | 01 | 01 | - |
| | | 12 වන විවෘත මිත්‍ර තයිකොන්ඩෝ තරගාවලිය | ඇමරිකා එක්සත් ජනපදය | - | 01 | - |






**2016 වර්ෂය තුළ දී ලබාගත් ජාත්‍යන්තර තරග ජයග්‍රහණයන්ගෙන් උදම් වී.........**

## 1.3. <u>ක්‍රීඩා ශක්ති වැඩසටහන</u>

ක්‍රීඩා අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවනු ලබන ක්‍රීඩා ශක්ති වැඩසටහන 2016 මැයි මාසයේ දී නව මුහුණුවරකින් ආරම්භ විය. ඒ අනුව දිස්ත්‍රික් 25 තුළ ම මෙම වැඩසටහන ක්‍රියාත්මක වන අතර, අවම වශයෙන් එක් දිස්ත්‍රික්කයක් තුළ ක්‍රීඩා 10 ක් ඇතුළත් වන පරිදි ක්‍රීඩාවන් 28 ක් සඳහා මෙම සංචිත ක්‍රියාත්මක වේ.

## 1.3.1 ජුනි සිට සැප්තැම්බර් දක්වා ක්‍රීඩා ශක්ති සංචිත සඳහා තෝරා ගත් ක්‍රීඩක/ ක්‍රීඩිකාවන්

| අනු අංක | ක්‍රීඩාව | උපරිම සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | කාන්තා | පිරිමි |
| 01 | මළල ක්‍රීඩා | 916 | 953 |
| 02 | පාපන්දු | 728 | 946 |
| 03 | වොලිබෝල් | 670 | 829 |
| 04 | කබඩි | 552 | 545 |
| 05 | නෙට්බෝල් | 1006 | - |
| 06 | පැසිපන්දු | 362 | 464 |
| 07 | හොකී | 287 | 235 |
| 08 | බැඩ්මින්ටන් | 151 | 196 |
| 09 | මල්ලවපොර | 18 | 131 |
| 10 | බර ඉසිලීම | 112 | 164 |
| 11 | ජූඩෝ | 189 | 211 |
| 12 | බොක්ෂිං | 88 | 171 |
| 13 | ජිම්නාස්ටික් | 119 | 121 |
| 14 | වුෂු | 40 | 52 |
| 15 | පිහිණුම් | 153 | 264 |
| 16 | තයිකොන්ඩෝ | 116 | 227 |
| 17 | රගර් | 128 | 159 |
| 18 | වෙරළ වොලිබෝල් | 68 | 77 |
| 19 | වෙරළ නෙට්බෝල් | 34 | - |

| අනු අංක | ක්‍රීඩාව | උපරිම සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | කාන්තා | පිරිමි |
| 20 | වෙරළ කබඩි | 13 | 40 |
| 21 | මේස පන්දු | 126 | 136 |
| 22 | පා පැදි | 12 | 49 |
| 23 | සැහැල්ලු පන්දු ක්‍රිකට් | 223 | 303 |
| 24 | ත්‍රෝ බෝල් | 37 | 55 |
| 25 | කරාතේ දෝ | 165 | 295 |
| 26 | කඹ ඇදීම | 34 | - |
| 27 | රෝල් බෝල් | 79 | 128 |
| 28 | හැන්ඩ් බෝල් | 66 | 85 |
| එකතුව | | **6492** | **6836** |

ඔක්තෝම්බර් මාසයේ දී ක්‍රීඩක/ ක්‍රීඩිකාවන් ගේ පුහුණුවීම් කටයුතු ආරම්භ කළ අතර පුහුණුවීම් කටයුතුවල නිරත ක්‍රීඩක/ ක්‍රීඩිකාවන්හට මසකට පැය 24 ක පුහුණු කාලයක් සඳහා රුපියල් 1400 ක දීමනාවක් ද, පුහුණුකරුවන් සඳහා මසකට රුපියල් 4800 ක දීමනාවක් ද ලබා දේ. මේ වන විට ක්‍රීඩා ශක්ති දිස්ත්‍රික් සංචිත වැඩසටහන යටතේ දිස්ත්‍රික් 25 තුළ සංචිත 46 ක පුහුණුකරුවන් 599 ක් යටතේ ක්‍රීඩක/ ක්‍රීඩිකාවන් 13328 ක් පුහුණුවීම් වල නිරත වේ.

දීප ව්‍යාප්තව විසිරී සිටින ක්‍රීඩා කෞශල්‍යයන්ගෙන් හෙබි ක්‍රීඩක/ ක්‍රීඩිකාවන් හඳුනාගෙන ඔවුන්ගේ ක්‍රීඩා දක්ෂතා දියුණු කිරීම මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමේ මූලික පරමාර්ථය වේ.





ක්‍රීඩා ශක්ති වැඩසටහනේ විශේෂ අවස්ථාවන්

## 1.4. ක්‍රීඩා කෞශල්‍යයන් සඳහා ප්‍රවේශය සහතික කිරීමේ ව්‍යාපෘතිය

ජාත්‍යන්තර තරඟවල දී මෙන්ම 2024, 2028 හා ඉන් ඉදිරියට ඔලිම්පික් තරඟවල දී සුවිශේෂ දක්ෂතා දැක්විය හැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් බිහි කිරීමේ අරමුණින් ක්‍රීඩා කෞශල්‍යයන්ගෙන් හෙබි දරුවන් හඳුනාගෙන ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

ක්‍රීඩා අමාත්‍යාංශයත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ව 2016 වර්ෂයේ දී ආරම්භ කරන ලද මෙම වැඩසටහන කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන වශයෙන් කාලපරිච්ඡේදයන් 03 ක් තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

වැඩසටහනට අදාළව ජාතික මට්ටමේ සම්පත්දායකයින් 124 දෙනෙකු පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2016.06.16 දින ක්‍රීඩා අමාත්‍යාංශයේ දී පැවැත් වූ අතර එම වැඩසටහනට සමගාමීව පළාත් සභා විසින් ද පළාත් ක්‍රීඩා නිලධාරීන් පුහුණු කිරීමේ වැඩමුළු පවත්වන ලදී.

තෝරා ගනු ලබන සිසුන් පුහුණු කිරීම සඳහා ස්ථාපිත කර ඇති පුහුණු මධ්‍යස්ථාන වලට අයත් විදුහල්වල විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන 2016. 11.24 දින අරලියගහ මන්දිරයේ දී පැවැත්වීය.

පුහුණු සංචිත සඳහා පාසැල් සිසුන් තෝරා ගැනීමේ පරීක්ෂණය 2016.11.28 සහ 29 යන දිනවල දී දිවයින පුරා පාසැල් 3101 දී පැවැත් වූ අතර පාසැල් සිසුන් 161872 පරීක්ෂණයට භාජනය කරන ලදී. මෙම වැඩසටහන සඳහා 2016 වර්ෂය තුළ දී රු. මිලි. 49.69 ක් වැය දරා ඇත.

ස්ථාපිත කර ඇති පුහුණු මධ්‍යස්ථාන 315 සඳහා ක්‍රීඩා භාණ්ඩ බෙදා දීම හා තෝරාගත් පාසල් සිසුන්ට පුහුණු මධ්‍යස්ථානවල පුහුණුව ලබා දීම 2017 වර්ෂයේ දී ආරම්භ කිරීමට නියමිතය.




ක්‍රීඩා කෞශල්‍යයන් සඳහා ප්‍රවේශය සහතික කිරීමේ ව්‍යාපෘතියේ ක්‍රියාත්මක අවස්ථා කිහිපයක්......





## 1.5. දිස්ත්‍රික් පුහුණු කඳවුරු

දිස්ත්‍රික්ක පුරා විසිරී සිටින, ක්‍රීඩාව සඳහා සහජ දක්ෂතා සහිත දරු දැරියන් හඳුනා ගැනීමත්, ඔවුන් දක්ෂතා දක්වන ක්‍රීඩාවන්ට යොමු කොට ඔවුන්ගේ කුසලතා වර්ධනයට ඉවහල් වන පරිදි බාහිර පුහුණුකරුවන් මඟින් ජාතික මට්ටමේ දී පුහුණුව ලබා දී, අඛණ්ඩව පුහුණුව ලබා දීම සඳහා දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කිරීමත්, ඒ ඒ වයස් කාණ්ඩවලට අදාල දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා ශක්ති වැඩ සටහන හරහා සංවිතගත කිරීමත් මෙම වැඩ සටහනේ අරමුණ වේ. එක් දිස්ත්‍රික්කයක් සඳහා මාසිකව රු 25,000 ක මුදලක් ලබා දෙන අතර එක් මසකට එක් දිස්ත්‍රික්කයක එක් ක්‍රීඩාවක් වෙනුවෙන් පුහුණු කඳවුරක් බැගින් පැවැත්වේ.

දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි මළල ක්‍රීඩා, වොලිබෝල්, නෙට්බෝල්, කබඩි, වෙරළ වොලිබෝල්, හොකී, රගර්, ජූඩෝ, පිහිණුම්, පාපැදි, පාපන්දු, මල්ලව පොර, බැඩ්මින්ටන්, බර ඉසිලීම, පැසිපන්දු, ක්‍රිකට්, කඹ ඇදීම යන ක්‍රීඩා වෙනුවෙන් පුහුණු කඳවුරු 75 ක් පවත්වා ඇති අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් 4919 ක් හා නිලධාරින් 410 ක් මේ සඳහා සහභාගි වී ඇත. මෙම වැඩ සටහන සඳහා රුපියල් මිලියන 1.875 ක් වැය දරා ඇත.










**දිස්ත්‍රික් පුහුණු කඳවුරුවල විශේෂ අවස්ථා.......**

## 1.6 මානව සම්පත් කළමනාකරණය

## 1.6.1. කාර්ය මණ්ඩල විස්තර

### 1.6.1.1. 2016 වර්ෂයේ මුළු සේවක බඳවා ගැනීම්

| අංකය | නව පත්වීම් | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|---|
| 01 | ස්ථිර සේවය | 163 | 78 | 241 |
| 02 | කොන්ත්‍රාත් / අනියම් | 02 | - | 02 |
| එකතුව | | **165** | **78** | **243** |

### 1.6.1.2 2016 වර්ෂයේ සේවයෙන් ඉවත්වීම් සහ ස්ථාන මාරුවීම්


| අංකය | සේවයෙන් ඉවත්වීම් | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|---|
| 01 | විශ්‍රාම යාම් සංඛ්‍යාව | 02 | - | 02 |
| 02 | සේවයෙන් ඉල්ලා අස්වීම් සංඛ්‍යාව | - | 01 | 01 |
| 03 | ස්ථාන මාරුවීම් ( ශුද්ධ) | 08 | 03 | 11 |
| 04 | ස්ථාන මාරුවී පැමිණි | 04 | 04 | 08 |
| 05 | වෙනත් (නව බඳවා ගැනීම) | 04 | 01 | 05 |
| 06 | ඉවත්ව යන මුළු සේවක සංඛ්‍යාව | 02 | 01 | 03 |
| එකතුව | | **20** | **10** | **30** |

### 1.6.1.3. 2016.12.31 දිනට කාර්ය මණ්ඩල විස්තර

| අංකය | තනතුර | වැටුප්තලය | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | අනුමත | සිටින | පුරප්පාඩු |
| 01 | අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.ප.1 විශේෂ) | SL 1 | 01 | 01 | - |
| 02 | අධ්‍යක්ෂ (පාලන) (ශ්‍රී.ලං.ප.1) | SL 1 | 01 | 0 | 01 |
| 03 | අධ්‍යක්ෂ (සැලසුම්) (ශ්‍රී.ලං.ක්‍ර.1) | SL 1 | 01 | 01 | - |
| 04 | අධ්‍යක්ෂ (ඉංජිනේරු) (ශ්‍රී.ලං.ඉ.1) | SL 1 | 01 | 01 | - |
| 05 | ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී.ලං.ග.1) | SL 1 | 01 | 01 | - |
| 06 | අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.1) | SL 1 | 01 | 01 | - |

| අංකය | තනතුර | වැටුප්තලය | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | අනුමත | සිටින | පුරප්පාඩු |
| 07 | අධ්‍යක්ෂ (ක්‍රීඩා) (දෙපා. 1) | SL 1 | 01 | - | 01 |
| 08 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (පාලන) (ශ්‍රී.ලං.ප.11/111) | SL 1 | 01 | 01 | - |
| 09 | ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග. 11/111) | SL 1 | 02 | 01 | 01 |
| 10 | ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.11/111) | SL 1 | 01 | 01 | - |
| 11 | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) (දෙපා. 11/111) | SL 1 | 04 | 01 | 03 |
| 12 | සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) (දෙපා. 111) | MN 7 | 01 | - | 01 |
| 13 | කළමනාකරණ සහකාර (අධි පන්තිය) | MN 7 | 01 | 01 | - |
| 14 | භාෂා පරිවර්තක | MN 6 | 01 | 01 | - |
| 15 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | MN 6 | 01 | 01 | - |
| 16 | සංවර්ධන නිලධාරි (දෙපාර්තමේන්තුගත) | MN 4 | 04 | 01 | 03 |
| 17 | මානව සම්පත් සංවර්ධන සහකාර (දෙපාර්තමේන්තුගත) | MN 4 | 01 | - | 01 |
| 18 | සංවර්ධන නිලධාරි (නව) | MN 4 | 55 | 35 | 20 |
| 19 | සැලසුම් හා වැඩ සටහන් සහකාර (දෙපාර්තමේන්තුගත) | MN 4 | 02 | 01 | 01 |
| 20 | මූලස්ථාන ක්‍රීඩා නිලධාරි | MN 3 | 20 | 19 | 01 |
| 21 | ක්‍රීඩා පුහුණුකරු | MN 3 | 103 | 77 | 26 |
| 22 | ක්‍රීඩා නිලධාරි | MN 3 | 40 | 39 | 01 |
| 23 | තාක්ෂණ නිලධාරි | MN 3 | 02 | 01 | 01 |
| 24 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | MT 1 | 01 | 01 | - |
| 25 | කළමනාකරණ සහකාර (පංතිය 1/11/111) | MN 2 | 23 | 11 | 12 |
| 26 | නිවාස පාලක | MN 1 | 02 | - | 02 |
| 27 | සහකාර නිවාස පාලක | MN 1 | 01 | 01 | - |
| 28 | රියදුරු සේවය (පංතිය 1,11අ/11 ආ) | PL 3 | 12 | 10 | 02 |
| 29 | අරක්කැමි | PL 2 | 01 | 01 | - |
| 30 | සහකාර අරක්කැමි | PL 1 | 02 | 02 | - |
| 31 | කා.සේ. සේ (1/11/111) | PL 1 | 12 | 19 | - |
| 32 | ක්‍රීඩා භූමි සහායක | PL 1 | 25 | 13 | 12 |
| එකතුව | | | **325** | **243** | **89** |

### 1.6.1.4. සංවිධාන ව්‍යුහය



### 1.6.1.5 දෙපාර්තමේන්තු නිලධාරින් සහභාගි වූ පුහුණු වැඩමුළු

| අංකය | පුහුණු වැඩසටහනේ නම | පැවැත් වූ ආයතනය | පැවැත් වූ කාලසීමාව | නිලධාරී බාණ්ඩය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | පුද්ගලික ලිපි ගොණු පිළිබඳ පාඨමාලාව | නිපුණතා සංවර්ධන අරමුදල | 2016.01.20 - 21 | සංවර්ධන නිලධාරී | 01 |
| 02 | රියදුරන් සඳහා පිරිමැසුම්දායී හා ආරක්ෂාකාරී රිය පැදවීම | ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 2016.03.01 | රියදුරු | 01 |
| 03 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ පාඨමාලාව | නිපුණතා සංවර්ධන අරමුදල | 2016.03.03 - 04 | සංවර්ධන නිලධාරී | 01 |
| 04 | ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය, වගකීම් පිළිබඳ පාඨමාලාව | නිපුණතා සංවර්ධන අරමුදල | 2016.05.16 - 17 | සංවර්ධන නිලධාරී | 01 |
| 05 | වැටුප් පරිවර්තන පිළිබඳ පුහුණු පාඨමාලාව | නිපුණතා සංවර්ධන අරමුදල | 2016.05.12 - 13 | සංවර්ධන නිලධාරී | 02 |
| 06 | දෙමළ භාෂාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | මාස 06 | සහකාර අධ්‍යක්ෂ (පාලන) | 01 |
| 07 | කාර්යාල කළමණකාරණය හා කාර්යාල ක්‍රමවේදය පිළිබඳ පාඨමාලාව | නිපුණතා සංවර්ධන අරමුදල | 2016.08.11-12 | සංවර්ධන නිලධාරී කළමනාකරණ සහකාර | 03 |
| 08 | තොරතුරු තාක්ෂණයට අදාල භාණ්ඩ ප්‍රසම්පාදනය හා ඇගයීම පිළිබඳ පාඨමාලාව | නිපුණතා සංවර්ධන අරමුදල | 2016.08.30 - 31 | සංවර්ධන නිලධාරී | 01 |
| 09 | ශාරීරික යෝග්‍යතා පුහුණු පාඨමාලාව | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | මාස 05 | ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් | 05 |
| 10 | උසස් ක්‍රීඩා කළමනාකරණ පාඨමාලාව | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | මාස 01 | ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් | 01 |
| 11 | ක්‍රීඩා ආබාධ කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | දින 18 | ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් | 05 |
| 12 | ජාත්‍යන්තර වොලිබෝල් පුහුණු පාඨමාලාව අදියර 03 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | දින 12 | ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් | 01 |
| 13 | ආයතනික ගැටුම් විසඳීම පිළිබඳ වැඩමුළුව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 2016.08.09 | පරිපාලන නිලධාරී | 01 |
| 14 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පාඨමාලාව | Prag ආයතනය | 2016.09.02 – 2016.09.28 | සංවර්ධන නිලධාරී | 01 |
| 15 | වැටුප් කළමණාකරනය පිළිබඳ පාඨමාලාව | Prag ආයතනය | 2016.10.11 | සංවර්ධන නිලධාරී | 01 |

### 1.6.1.6 ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් සහභාගී වූ විදේශීය පුහුණු පාඨමාලා

| අනු අංකය | පුහුණුව | පුහුණුව ලද රට | පුහුණු කාලය | සහභාගී වූ නිලධාරි කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | තාක්ෂණික වොලිබෝල් පුහුණුකරු පාඨමාලාව | බහරේන් | 2016.04.16 - 2016.04.30 | ක්‍රීඩා පුහුණුකරු | 03 |
| 02 | ශක්ති වර්ධන හා ශාරීරික යෝග්‍යතා පුහුණු පාඨමාලාව | ඉන්දියාව | 2016.05.07 - 2016.06.04 | ක්‍රීඩා පුහුණුකරු | 19 |
| 03 | ආසියානු බර ඉසිලීමේ සංගමය මගින් පැවැත් වූ පුහුණුකරුවන්ගේ පාඨමාලාව | චීනය | 2016.02.28 - 2016.03.07 | ක්‍රීඩා නිලධාරී | 01 |
| 04 | පාපැදි පුහුණුකරුවන්ගේ පාඨමාලාව | දකුණු කොරියාව | 2016.04.27 - 2016.05.27 | ක්‍රීඩා නිලධාරී | 01 |
| 05 | ක්‍රීඩා කළමනාකරණ පාඨමාලාව | ජර්මනිය | 2016.03.30 - 2016.08.03 | ක්‍රීඩා නිලධාරී | 01 |
| 06 | ව්‍යාපෘති කළමනාකරණ පුහුණු පාඨමාලාව | මැලේසියාව | 2016.12.10 - 2016.12.20 | මාණ්ඩලික නිලධාරීන්<br>ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් | 02<br>15 |
| 07 | උපායශීලී කළමණාකරන නායකත්ව පුහුණු වැඩසටහන | නවසීලන්තය | 2016.06.05 - 2016.06.12<br>2016.06.18 - 2016.06.25 | මාණ්ඩලික නිලධාරීන් | 08 |
| 08 | Five Technical Seminar Sitting පාඨමාලාව | තායිලන්තය | 2016.10.23 - 2016.10.29 | මාණ්ඩලික නිලධාරීන් | 04 |
| 09 | ජාත්‍යන්තර විශේෂඥ පුහුණුකරුවන්ගේ පුහුණු සම්මන්ත්‍රණ පාඨමාලාව | ඉතාලිය | 2016.10.27 - 2016.11.04 | මාණ්ඩලික නිලධාරී | 01 |
| 10 | ක්‍රීඩා කළමණාකරණ පාඨමාලාව | ඉන්දියාව | 2016.10.10 - 2016.10.23 | ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් | 15 |
| 11 | ජාත්‍යන්තර මළල ක්‍රීඩා පාඨමාලාව | දකුණු කොරියාව | 2016.10.16 - 2016.11.01 | ක්‍රීඩා පුහුණුකරු | 01 |
| 12 | ක්‍රීඩා කළමණාකරණ පාඨමාලාව | කොරියාව | 2016.09.09 – 2017.09.01 | ක්‍රීඩා නිලධාරී | 01 |
| 13 | අධ්‍යාපන චාරිකාව | මැලේසියාව | 2016.06.11 - 2016.06.18 | ක්‍රීඩා නිලධාරී | 04 |
| 14 | අධ්‍යාපන චාරිකාව | මැලේසියාව | 2016.06.11 - 2016.06.18 | ක්‍රීඩා නිලධාරී | 01 |
| 15 | South Asian Shuttle Time Tutor Course | මාලදිවයින | 2016.10.05 – 2016.10.11 | ක්‍රීඩා නිලධාරී | 01 |

**ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් සහභාගී වූ විදේශීය පුහුණු පාඨමාලාවක එක් අවස්ථාවක්.....**

## 2. <u>යටිතල පහසුකම් සංවර්ධනය</u>

### 2.1. <u>පළාත් ක්‍රීඩා සංකීර්ණ හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම</u>

දිවයින පුරා පිහිටි සෑම පළාතක් සඳහා ම ජාත්‍යන්තර පහසුකම්වලින් සමන්විත පළාත් ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමටත්, පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදි නොකෙරෙන දිස්ත්‍රික්ක ආවරණය කිරීම සඳහා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීමටත් 2011 දී අමාත්‍ය මණ්ඩල සංදේශයකට අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව මේ වන විට පළාත් 9 ම ආවරණය වන පරිදි පළාත් ක්‍රීඩා සංකීර්ණයන් ඉදි කෙරෙමින් පවතින අතර ඉතිරි දිස්ත්‍රික් 16 ක් ආවරණය වන පරිදි සියලු පහසුකම්වලින් සමන්විත දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයන් ද ඉදි කෙරෙමින් පවතී.

පළාත් ක්‍රීඩා සංකීර්ණයන් මීටර් 400 ධාවන පථයක්, පුහුණු ධාවන පථයක්, ක්‍රිකට් ක්‍රීඩාංගණයක්, ප්‍රේක්ෂකාගාරයක්, මීටර් 50 පිහිණුම් තටාකයක්, ගෘහස්ථ ක්‍රීඩාගාරයක් හා ක්‍රීඩා වෛද්‍ය ඒකකයක් සහිතව ඉදි කෙරෙමින් පවතී. එමෙන්ම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයන් මීටර් 25 පිහිණුම් තටාකයක්, මීටර් 400 ධාවන පථයක්, ගෘහස්ථ ක්‍රීඩාගාරයක් හා ප්‍රේක්ෂකාගාරයක් යන අංගයන් සහිතව ඉදි කෙරෙමින් පවතී.

උතුරු මැද හා ඌව පළාත් ක්‍රීඩා සංකීර්ණත්, මඩකලපුව, මාතර, පොළොන්නරුව හා යාපනය දොරෙයිඅප්පා යන දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණත් මේ වනවිට ජනතා අයිතියට පත් කර ඇත. සැලසුම් කළ පරිදි ඉදිකිරීම් අවසන් කර ඇති කළුතර, පුත්තලම හා අම්පාර යන දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණත්, දිගන හා ත්‍රිකුණාමලය මැකේෂර් පළාත් ක්‍රීඩා සංකීර්ණත් 2017 වර්ෂයේ දී විවෘත කිරීමට නියමිතය.

## 2.1.1. ජනතා අයිතියට පවරා ඇති පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයන්.

| අංක | පළාත්/ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ නම | පළාත/ දිස්ත්‍රික්කය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි) | 2016.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි) | ජනතා අයිතියට පවරා ඇති දිනය |
|---|---|---|---|---|---|
| 1 | බදුල්ල වින්සන්ට් ඩයස් ක්‍රීඩා සංකීර්ණය | ඌව පළාත | 411.70 | 281.52 | 2014.12.05 |
| 2 | අනුරාධපුර පළාත් ක්‍රීඩා සංකීර්ණය | උතුරු මැද පළාත | 317.61 | 293.36 | 2014.05.08 |
| 3 | මාතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | මාතර දිස්ත්‍රික්කය | 300.86 | 290.38 | 2016.07.04 |
| 4 | මඩකලපුව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | මඩකලපුව දිස්ත්‍රික්කය | 244.30 | 232.14 | 2016.07.06 |
| 5 | පොළොන්නරුව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | පොළොන් නරුව දිස්ත්‍රික්කය | 241.08 | 218.67 | 2016.08.25 |
| 6 | යාපනය දොරෛයිඅප්පා ක්‍රීඩා සංකීර්ණය | යාපනය දිස්ත්‍රික්කය | ඉන්දියානු රජයේ ආධාර මත ඉදි කෙරිණි | | 2016.06.18 |










**2.1.2. ඉදිකිරීම් ආරම්භ කර ඇති පළාත් ක්‍රීඩා සංකීර්ණයන් හා ඒවායේ ප්‍රගතිය.**

| අංක | පළාත් ක්‍රීඩා සංකීර්ණයේ නම | පළාත | ඇස්තමේන්තු ගත මුදල (රු.මි) | 2016.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි) | 2016 වාර්ෂික ප්‍රතිපාදන (රු.මි) | 2016.12.31 දිනට වියදම (රු.මි) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 1 | දිගන කුණ්ඩසාලේ පළාත් ක්‍රීඩා සංකීර්ණය | මධ්‍යම පළාත | 490.00 | 403.70 | 60.00 | 97.63 | 2017.03.01 දින ජනතා අයිතියට පැවරීමට නියමිතය. |
| 2 | ත්‍රිකුණාමලය මැකේෂයර් ක්‍රීඩා සංකීර්ණය | නැගෙනහිර පළාත | 386.40 | 221.19 | 80.00 | 32.49 | නීතිමය ගැටළුවක් පවතින බැවින් ධාවන පථය හැර ඉතිරි අංගයන් 2017.03.17 දින ජනතා අයිතියට පැවරීමට නියමිතය. |
| 3 | කිලිනොච්චිය පළාත් ක්‍රීඩා සංකීර්ණය | උතුරු පළාත | 332.92 | 285.70 | 75.60 | 56.61 | 80% |
| 4 | රත්නපුර මහජන ක්‍රීඩා සංකීර්ණය | සබරගමු පළාත | 304.08 | 141.69 | 75.00 | 67.54 | 65% |
| 5 | බිංගිරිය පළාත් ක්‍රීඩා සංකීර්ණය | වයඹ පළාත | 511.89 | 0.10 | 50.00 | 0.10 | 5% |










## 2.1.3. ඉදිකිරීම් ආරම්භ කර ඇති දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයන් හා ඒවායේ ප්‍රගතිය.

| අංක | ව්‍යාපෘතියේ නම සහ ව්‍යාපෘති අංගයන් | ඇස්තමේන්තු මුදල (රු.මි) | 2016.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි) | 2016 ප්‍රතිපාදන (රු.මි) | 2016.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 2016.12.31 දිනට භෞතික ප්‍රගතිය% | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| 1 | පුත්තලම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 266.88 | 242.01 | 55.67 | 47.46 | 95% | 2017 වර්ෂයේ දී විවෘත කිරීමට නියමිතයි |
| | පිහිණුම් තටාකය | 34.72 | 31.58 | - | 0.000 | 100% | |
| | ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය | 156.35 | 124.11 | - | 28.99 | 100% | |
| | 400 ධාවන පථය | 60.81 | 55.36 | - | 2.06 | 100% | |
| | අමතර වැඩ | 15.00 | 30.96 | - | 16.41 | 95% | |
| | | | | | | | |
| 2 | කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 245.35 | 237.30 | 19.87 | 3.48 | 100% | 2017 වර්ෂයේ දී විවෘත කිරීමට නියමිතයි |
| | පිහිණුම් තටාකය | 33.13 | 31.38 | - | 0.06 | 100% | |
| | ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය | 147.53 | 147.20 | - | 2.21 | 100% | |
| | 400 ධාවන පථය | 48.33 | 48.32 | - | 1.21 | 100% | |
| | අමතර වැඩ | 16.36 | 10.40 | - | 0.00 | 100% | |
| | | | | | | | |
| 3 | අම්පාර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 237.80 | 186.03 | 62.77 | 3.25 | 100% | 2017 වර්ෂයේ දී විවෘත කිරීමට නියමිතයි |
| | පිහිණුම් තටාකය | 38.13 | 23.14 | - | 0.00 | 95% | |
| | ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය | 134.36 | 105.69 | - | 2.25 | 100% | |
| | 400 ධාවන පථය | 50.31 | 39.42 | - | 0.00 | 100% | |
| | අමතර වැඩ | 15.00 | 17.78 | - | 1.00 | 100% | |
| | | | | | | | |
| 4 | මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 214.22 | 45.01 | 50.00 | 0.17 | 5% | ඉදිකිරීම් සිදුවෙමින් පවතී |
| | පිහිණුම් තටාකය | 43.11 | 7.77 | - | - | 5% | |
| | ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය | 119.28 | 23.86 | - | - | 5% | |
| | 400 ධාවන පථය | 51.83 | 9.34 | - | - | 5% | |
| | අමතර වැඩ | | 4.04 | - | 0.17 | | |

| අංක | ව්‍යාපෘතියේ නම සහ ව්‍යාපෘති අංගයන් | ඇස්තමේන්තු මුදල (රු.මි) | 2016.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි) | 2016 ප්‍රතිපාදන (රු.මි) | 2016.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 2016.12.31 දිනට භෞතික ප්‍රගතිය% | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| 5 | කෑගල්ල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 242.45 | 100.77 | 50.00 | 44.72 | 50% | ඉදිකිරීම් සිදුවෙමින් පවතී |
| | පිහිණුම් තටාකය | 40.28 | 15.23 | - | 7.17 | 50% | |
| | ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය | 140.14 | 58.05 | - | 25.68 | 50% | |
| | 400 ධාවන පථය | 62.03 | 23.21 | - | 11.82 | 50% | |
| | අමතර වැඩ | - | 4.28 | - | 0.05 | | |
| | | | | | | | |
| 6 | ගාල්ල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 209.63 | 83.91 | 50.00 | 35.54 | 60% | ඉදිකිරීම් සිදුවෙමින් පවතී |
| | පිහිණුම් තටාකය | 40.43 | 10.97 | - | 3.68 | 55% | |
| | ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය | 121.36 | 46.10 | - | 17.59 | 55% | |
| | 400 ධාවන පථය | 47.83 | 23.34 | - | 13.77 | 65% | |
| | අමතර වැඩ | - | 3.50 | - | 0.50 | 10% | |
| | | | | | | | |
| 7 | මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 215.42 | 60.60 | 50.00 | 16.21 | 50% | ඉදිකිරීම් සිදුවෙමින් පවතී |
| | පිහිණුම් තටාකය | 40.34 | 11.90 | - | 4.37 | 55% | |
| | ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය | 122.92 | 35.65 | - | 11.76 | 45% | |
| | 400 ධාවන පථය | 52.16 | 9.40 | - | 0.00 | 60% | |
| | අමතර වැඩ | - | 3.65 | - | 0.07 | 15% | |
| | | | | | | | |
| 8 | වව්නියාව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 215.47 | 119.20 | 50.00 | 53.62 | 60% | ඉදිකිරීම් සිදුවෙමින් පවතී |
| | පිහිණුම් තටාකය | 43.69 | 16.80 | - | 9.02 | 60% | |
| | ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය | 120.81 | 58.73 | - | 29.06 | 60% | |
| | 400 ධාවන පථය | 50.97 | 37.34 | - | 14.94 | 55% | |
| | අමතර වැඩ | - | 6.33 | - | 0.60 | 0% | |
| | | | | | | | |
| 9 | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 209.67 | 45.53 | 41.63 | 0.10 | 20% | ඉදිකිරීම් සිදුවෙමින් පවතී |
| | පිහිණුම් තටාකය | 42.41 | 7.60 | - | 0.00 | 15% | |
| | ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය | 119.38 | 23.88 | - | 0.00 | 12.5% | |
| | 400 ධාවන පථය | 47.88 | 8.63 | - | 0.00 | 10% | |
| | අමතර වැඩ | - | 5.42 | - | 0.10 | 0% | |













## 2.2. ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය

ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය යටතේ දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණ වන ලෙසට 2016.12.31 දින වන විට ක්‍රීඩා පිටි 289 ක් සංවර්ධනය කර ඇත. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය හා ප්‍රතිපාදන මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය සිදු කර ඇත.

මේ යටතේ ග්‍රාමීය ප්‍රදේශවල පාසල් හා අනෙකුත් ක්‍රීඩික ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් ඔප්නැංවීමේ අරමුණින් පාසල් ක්‍රීඩා පිටි හා ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමත්, අනෙකුත් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් සිදු කර ඇත.

ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය සාර්ථක ලෙස සිදු කරගෙන යාමට 2016 වර්ෂය සඳහා රුපියල් මිලියන 444.20 ක ප්‍රතිපාදන වෙන් වී ඇත. වර්ෂාවසානයේ දී රුපියල් මිලියන 389.68 ක වැය දැරීමක් සිදු වී ඇති අතර දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අතැති බිල් වටිනාකම රු. මිලි. 33.68 කි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය රු. මිලි. 423.36 ක් වන අතර භෞතික ප්‍රගතිය 95% දක්වා වර්ධනය කර ගැනීමට හැකි වී ඇත.

| අංකය | වැය විෂය හා වැය ශීර්ෂ අංකය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලි.) | 2016.12.31 දිනට මුළු වියදම (රු.මිලි.) | | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ගණන | 2016.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| | | | ක්‍රී. සං. දෙ. | දිස්ත්‍රික් ලේකම් හර කිරීම | | |
| 01 | 2001-1 ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධන ව්‍යාපෘතිය | 25.00 | - | 22.19 | 15 | 95% |
| 02 | 2502 ග්‍රාමීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කෞශල්‍යන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 379.20 | 72.19 | 257.22 | 263 | 95% |
| 03 | 2104-12 පාසල් ක්‍රීඩාපිටි සංවර්ධන ව්‍යාපෘතිය | 40.00 | 34.45 | 3.62 | 11 | 95% |
| | **එකතුව** | **444.20** | **106.64** | **283.03** | **289** | **95%** |







## 2.3. ජාතික ක්‍රීඩා කෞතුකාගාරය

ක්‍රීඩාවේ ඓතිහාසික වැදගත්කම අනාගත පරපුරට උරුමකර දීමටත්, ක්‍රීඩාව හා බැදි සිහිවටනයන් සංරක්ෂණය කර තබා ගැනිමත් උදෙසා ජාතික ක්‍රීඩා කෞතුකාගාරය ඉදි කරමින් පවති.

ක්‍රීඩාවේ ඉතිහාසය පිලිබඳ අනාගත පරපුර දැනුවත් කිරීම, ක්‍රීඩා විෂය හා අනුබද්ධ ලිපිලේඛන සහ ශ්‍රේෂ්ඨ ක්‍රීඩක ශුරතා සිහිවටන සංරක්ෂණය, ජාත්‍යන්තර ජයග්‍රහණ ලබාගත් ක්‍රීඩකයන්ගේ ජීවමාන ප්‍රමාණයේ පිළිරූ මැදිරියක් ඉදිකිරීම, ජාතික ක්‍රීඩා සංගම්වල ඉතිහාසය ඇතුළත් කිරිම සහ ක්‍රීඩා තොරතුරු ලබාගැනිමේ තොරතුරු මධ්‍යස්ථානයක් ඇති කිරීම මෙහි අරමුණු වේ.

එෆ්.ආර්.සේනානායක මැතිදුන්ගේ නිවස්නය වටා තිබූ අමතර ඉදිකීරිම් ඉවත්කොට පැරණි නිවස්නයේ ගාම්භීරත්වය මතුවන පරිදි ඉංග්‍රීසි පාලන සමයේ පැවති ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ශ්‍රී ලංකා නාවික හමුදාවේ සිවිල් ඉංජිනේරු අංශය විසින් ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.

මෙහි ඉහළ මාලයේ පිහිටුවීමට යෝජිත ක්‍රීඩා ලේඛණාගාරය සහ විද්‍යුත් ක්‍රීඩා පුස්තකාලයේ කටයුතු කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අංශයේ උපදේශකත්වයෙන් සැලසුම් කොට ඇත.

ශ්‍රී ලංකා ජාතික ක්‍රීඩා කෞතුකාගාරය ජාත්‍යන්තර ඔලිම්පික් ක්‍රීඩා කෞතුකාගාර ජාලය සමඟ සම්බන්ධ කිරිම සඳහා කෞතුකාගාරයේ සම්පූර්ණ ඉඩ ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් ඔලිම්පික් දර්ශන සඳහා වෙන්කිරීමට යෝජිතය. දැනට රටවල් 39 ක පවතින කෞතුකාගාර ජාලයේ 40 වන සමාජිකත්වය ලබාගැනීම සඳහා නව තෙමහල් ගොඩනැගිල්ලක් එෆ්.ආර් සේනානායක මැදුර පිටුපසින් ස්ථාපිත කිරිමට සැලසුම් කර ඇති අතර එය 2017 වර්ෂයේ දි ඉදී කිරිමට යෝජිතය. 2016 වර්ෂය වෙනුවෙන් රු. මිලියන 20ක ප්‍රතිපාදන වෙන්ව තිබූ අතර, වෙන් වූ මුළු මුදලම ඒ සඳහා වැය කර ඇත.







## 3. ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය

| අංකය | ව්‍යාපෘතියේ නම | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලි.) | 2016.12.31 දිනට අතැති බිල් පත් ද සමඟ සත්‍ය මූල්‍ය වියදම (රු.මිලි.) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 01 | ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය | 25.00 | 22.19 | 95% |
| 02 | දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම | 25.00 | 7.98 | 5% |
| 03 | ග්‍රාමීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කෞශල්‍යය වැඩි දියුණුකිරීමේ ව්‍යාපෘතිය | 379.20 | 363.09 | 95% |
| 04 | රීඩ් ඇවනිව් ක්‍රීඩා සංකීර්ණය | 50.00 | 23.88 | 85% |
| 05 | ටොරින්ටන් ක්‍රීඩා සංකීර්ණය | 50.00 | 28.13 | 90% |
| 06 | පාසල් ක්‍රීඩාංගණ නවීකරණය | 40.00 | 38.08 | 95% |
| 07 | කැගලු විද්‍යාලය /තෝලංගමුව ක්‍රීඩාංගනය සංවර්ධන ව්‍යාපෘතිය | 60.00 | 13.24 | 85% |
| 08 | පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම | 1000.00 | 994.58 | 90% |
| 09 | යාපනය දොරෙයිඅප්පා ක්‍රීඩා සංකීර්ණය නවීකරණය | 58.00 | 9.40 | 100% |
| 10 | වෙන්නප්පුව ඇල්ෆ්‍රඩ් පීරිස් ක්‍රීඩා පිටිය නවීකරණය | 20.00 | 15.41 | 95% |
| 11 | ජාතික ක්‍රීඩා කෞතුකාගාරය ඉදිකිරීම | 20.00 | 20.01 | 75% |
| 12 | ක්‍රීඩා කෞශල්‍යයන් හඳුනාගැනීමේ වැඩසටහන | 174.00 | 49.69 | 25% |
| 13 | ටොරින්ටන් ක්‍රීඩා සංකීර්ණයේ ප්‍රේක්ෂකාගාරය අලුත්වැඩියාව | 50.00 | 0.02 | 5% |
| 14 | දකුණු ආසියානු තරගාවලිය හා ක්‍රීඩා සංගම් | 100.00 | 99.99 | 100% |
| 15 | ක්‍රීඩා ශක්ති වැඩසටහන | 60.00 | 60.07 | 100% |

## 4. වැය විස්තරය

**විසර්ජන ගිණුම - 2016**
**වියදම් ශීර්ෂ අංකය - 219**

| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|---|
| වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩ සටහනෙහි නම | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම | මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ඉක්මවීම (4-5) |
| රුපියල් | | | | | | |
| පුනරාවර්තන | | | | | | |
| මෙහෙයුම් වැඩ සටහන | 58,050,000 | 823,594 | 2,900,000<br>-4,900,000 | 56,873,594 | 52,716,179 | 4,157,415 |
| සංවර්ධන වැඩ සටහන | 579,150,000 | 89,277,007 | 7,100,000<br>-5,100,000 | 670,427,007 | 654,128,724 | 16,298,283 |
| උප එකතුව (පුනරාවර්තන) | 637,200,000 | 90,100,601 | - | 727,300,601 | 706,844,903 | 20,455,698 |
| ප්‍රාග්ධන | | | | | | |
| මෙහෙයුම් වැඩ සටහන | 7,600,000 | 500,000 | - | 8,100,000 | 6,470,940 | 1,629,060 |
| සංවර්ධන වැඩ සටහන | 1,683,100,000 | 393,200,000 | - | 2,076,300,000 | 1,300,159,132 | 776,140,868 |
| උප එකතුව (මූලධන) | 1,690,700,000 | 393,700,000 | - | 2,084,400,000 | 1,306,630,072 | 777,769,928 |
| **සම්පූර්ණ එකතුව** | **2,327,900,000** | **483,800,601** | - | **2,811,700,601** | **2,013,474,975** | **798,225,626** |